**අධ්‍යාපන අමාත්‍යාංශය**
කල්வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

02 (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල භාෂාවේ ප්‍රභව කාලය නිශ්චය කිරීමේ දී, ඕනෑ ම භාෂාවක කාලයත් සමග ස්වාභාවික ව සිදු විය හැකි පරිණාමයට අමතර ව, ලක්දිව ආදිවාසී ගෝත්‍රික ජනයාට නවාවාසිකයන්ගේ භාෂාවට අනුවර්තනය වී මුළුමනින් එම ජන සමාජයෙහි අන්තර්ග්‍රහණය වීමට අවශ්‍ය වූ කාල පරිච්ඡේදය - එනම්, නවාවාසිකයන්ගේ පළමු-දෙපරපුරෙහි පටන් තවත් පරම්පරා තුනක / හතරක කාලයක්, - ඉඩ හළ යුතු වෙයි. මේ අනුව ප්‍රථම ආර්ය ජනාවාස පිහිටුවීමෙන් සියවස් එකහමාරක/දෙකක පමණ කාලය තුළ දී ස්වාධීන භාෂාවක් සෙයින් සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. තවත් අයුරකින් බලතොත් සිංහල ප්‍රාකෘතයේ ප්‍රථම ලිඛිත නිදර්ශන හමු වන කාලය වූ ක්‍රි. පූ. තෙවන සියවස තෙක් විහිදෙන සියවස් දෙකහමාරක් හෝ තුනක් හෝ පමණ වූ මුළු කාල පරිච්ඡේදය ම සිංහල ප්‍රාකෘතයේ සම්භව කාලය සේ ගත හැකි බව පෙනේ.

මිහිඳු මහ තෙරුන් ලක්දිවට පැමිණි පළමු දිනයෙහි පටන් ම දෙවනපෑතිස් රජු ඇතුළු ලක්වැසි සිංහලයන් සමග පහසුවෙනුත් සාර්ථක ලෙසත් සන්නිවේදන කටයුතු කර ගත හැකි වූයේ උන් වහන්සේ කථා කළ මධ්‍ය ඉන්දු-ආර්ය ප්‍රාකෘතය සිංහල ප්‍රාකෘතයෙන් එතරම් වෙනස් නුවූ නිසා යැයි තර්ක කළ හැකි ය. එහෙත්, තෘතීය ධර්ම සංගායනාවසානයෙහි විවිධ දේශවලට ධර්මදූතයන් පිටත් කර හැරීමේ දී ලක්දිවට පැමිණීමට නියමිත වූ මිහිඳු මහ තෙරුන් කෙළින් ම මෙහි නොපැමිණ පළමු ව වේදිසගිරියට ගොස්, එහි චේතියගිරි විහාරයෙහි සුදුසු කල් බලමින් ගත කළ මාස කීපය තුළ දී සිංහල ප්‍රාකෘතයෙහි වූ විශේෂ ලක්ෂණ පිළිබඳව අවබෝධයක් ලබා ගන්නට ඇතැයි සිතීම වඩාත් තර්කාන්විත ය. ධර්මදූත කාර්යයෙහි යෙදවූ තෙරුන් වහන්සේ සියලු දෙනා ම නිරුක්ති ප්‍රතිසම්භිදාප්‍රාප්තයන් වූ හෙයින්, ඒ සඳහා අවශ්‍ය භාෂා ව්‍යවහාර කුශලතාව ඉක්මනින් ලබා ගැනීමේ හැකියාව උන් වහන්සේට තිබෙන්නට ඇත.

සිංහල භාෂාවේ ප්‍රභව කාලය මේ අයුරින් නිශ්චය කිරීමේ දී, එහි ප්‍රභවය සිදු වූයේ කොහි ද යන ප්‍රශ්නයට ද නිතැතින් පිළිතුරු සැපයේ. එම විවරණයට අනුව, සිංහල ප්‍රාකෘතය ඉන්දියාවෙහි ප්‍රභව වූවක් නොව ලක්දිව දී ම ප්‍රභවය ලද්දක් බව පැහැදිලි වන හෙයිනි. එපමණක් නොව එම විවරණයෙන් ම එහි ප්‍රභවය සිදු වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට ද පිළිතුරු සැපයී ඇත. සිංහල ප්‍රාකෘතය පැන නැගුණේ උතුරු ඉන්දියාවෙන් ලක්දිවට වාර කිහිපයක දී පැමිණි ප්‍රථම ආර්ය ජානපදිකයන් කථා කළ පැරණි ඉන්දු-ආර්ය ප්‍රාකෘතයක් මවු රටේ මවු බස හා පැවති නිරන්තර සම්බන්ධතාව බිඳී ක්‍රමයෙන් වෙනස් වීමෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

(i) නව භාෂාවක ප්‍රභවය සිදු වන්නේ කවරාකාරයෙන් ද?
(ii) සිංහල ප්‍රාකෘතයේ පැරණි ම ලේඛන නිදර්ශන කවර කාලයකට අයත් ද?
(iii) මිහිඳු හිමියන්ට සාර්ථක ව සන්නිවේදන කාර්යයෙහි යෙදිය හැකි වූයේ කවර හේතු නිසා ද?
(iv) ලේඛකයා පවසන පරිදි සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු ව ඇත්තේ කොහි දී ද?
(v) ආර්ය සංක්‍රමණිකයන් පැමිණෙන විට මේ දිවයිනෙහි විසූ ජනයා කථා කළ භාෂා හඳුන්වා ඇත්තේ කවර නාමයකින් ද?
(vi) මේ ලේඛනයට අනුව සිංහල ප්‍රාකෘතයේ ප්‍රභවය සිදු වීමට බලපෑ කරුණ කුමක් ද?

(ලකුණු 02×6 = 12 යි)

**02.** (ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

'සමාජ උපභාෂා' ගැන සඳහන් කරතොත් එය කුල භේදය හා පන්ති භේදය අනුව භාෂා ව්‍යවහාර වෙනස් ස්වරූප ගැනීම නිසා සිදු වන්නකි. කුල උපභාෂා සඳහා ප්‍රකට උදාහරණයක් ලෙස භාරතයේ තමිල්නාඩු ප්‍රාන්තයේ භාවිත වන දෙමළ භාෂාවේ බ්‍රාහ්මණ කුලිකයන් හා බ්‍රාහ්මණ නොවන්නන් අතර පවතින භාෂාමය වෙනස්කම් දැක්වීමට පුළුවන. වෙනත් සමාජ ප්‍රභේදයක් වන පන්ති භේදය ප්‍රබල ව පවතින එංගලන්ත සමාජයේ භාවිත වන ඉංගිරිසි භාෂාවේ 'ඉහළ' හා 'පහළ' පන්තිවල කථා ව්‍යවහාරයේ පැහැදිලි වෙනස්කම් දැක්ක හැකි වීම පන්ති උපභාෂා සඳහා මහඟු උදාහරණයක් ලෙස සැලකේ. එබඳු ප්‍රදේශීය හා සමාජීය විවිධතා භාෂාව අභ්‍යන්තරයේ පවතින නමුත් සමස්ත වශයෙන් එකී භාෂාව තනි ඒකකයක් ලෙස සලකනු ලැබේ.

කෙබඳු උපභාෂාමය විවිධතාවක් පැවතුණ ද තමන් කිසියම් සුවිශේෂ භාෂා සමාජයකට අයත් යැයි භාෂකයෝ සිතත් නම්, පිළිගනිත් නම්, ඒ අනුව ක්‍රියාත්මක වන්නෝ නම් සමාජීය වශයෙන් වැදගත් වන්නේ එය යි. මී ළඟට සලකා බැලිය යුත්තේ 'ජාතික අනන්‍යතාව' යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද යන්න ය. නිරුක්ති වශයෙන් ගත හොත් 'අනන්‍ය' යන්න සෑදෙන්නේ 'න'- 'අන්‍ය' එනම් 'අනෙකක් නො වන' යන අරුත් ඇති පද දෙකක එකතුවෙනි. "අපි සිංහල" යැයි කියන විට අන්‍ය වූ 'දෙමළ', 'චීන', 'ජර්මන්' ආදි සකල විධ ස්වභාව බැහැර කිරීමක් සමග තමන්ගේ අසහායත්වය හා සුවිශේෂභාවය තහවුරු කරනු ලැබේ. 'ජාතිකත්වය' යන සංකල්පය හා සමග බද්ධ කොට ගෙන ජාතික අනන්‍යතාව ප්‍රකාශ කිරීමක් එම ප්‍රකාශනයෙහි ගැබ් ව ඇත. ජාතික අනන්‍යතාවට පදනම වන්නේ භාෂාව යැයි කිව හැකි වුව ද ඒ හා බැඳුණු තවත් වැදගත් සාධක දෙකක් ඇති බව මෙහි දී අමතක කළ හැකි නො වේ. එනම්, ආගම හා නිජ බිම යන කාරණා දෙක ය.

(ලකුණු 13යි)

**03.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන සාක්ෂරතාව ප්‍රවර්ධනයෙහි ලා සමාජ මාධ්‍යයේ දායකත්වය
(ii) අසමතුලිත ආහාර රටාව හේතුවෙන් ඇති වන ස්ථූලභාවය හා සමාජ ප්‍රශ්න
(iii) පාසල් සිසුන් පන්ති කාමර තුළ හිරිහැරයට ලක් වීමේ ප්‍රතිවිපාක
(iv) සංවර්ධනය හා මානව මැදිහත්වීමෙන් සිදුවන ආපදා

(ලකුණු 25යි.)

**04.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරිය හෝ කාර්ය මණ්ඩලය අමතන්නේ ය.
(ii) එම ඇඟලුම් ආයතනයෙහි සේවිකාවෝ සිය ගණනක් ඇත.
(iii) හෙතම මේ අදහස පළ කළේ සම්මාන ප්‍රදානෝත්සවයකට සහභාගි වෙමිනි.
(iv) ප්‍රකට සාහිත්‍යකරුවෙක් වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මෙරට නාට්‍ය කලාවට වෙසෙස් මෙහෙවරක් කළේ ය.
(v) සරසවි සිසුන් උද්ඝෝෂණ කරද්දී පොලිස් නිලධාරීන් එය වැළැක්වීමට පියවර ගත්හ.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) විනිශ්චය මණ්ඩලය අවසන් තරගය සඳහා තරගකරුවන් තිදෙනෙකු තෝරා ගත්තේ ය.
(ii) ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය සඳහා නව නියෝජිතවරියක පත් කරයි.
(iii) සංවිධායකයෝ උත්සවයට පැමිණි අප මහත් හරසරින් පිළිගත්හ.
(iv) ගම්වැසියෝ රිය අනතුරට ලක්වූවන් කඩිනමින් රෝහල්ගත කළහ.
(v) විදුහල්පතිවරයා ගුරුවරුන් ද සිසුසිසුවියන් ද රැස්වීම් ශාලාවට කැඳවයි.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) වැස්සෙන් පසු ගහ කොළ ද (පක්ෂීන්/පක්ෂීහු) ද ප්‍රබෝධයට පත් (විය /වූහ).
(ii) (කලාකරුවෝ/කලාකරුවන්) සමාජ ප්‍රගමනය උදෙසා කැප විය (යුත්තේ ය/ යුත්තාහ).
(iii) ඉන්දීය රජයේ (ඇමතිවරයෙක්/ඇමතිවරයකු) ලබන සතියේ මෙරටට (පැමිණෙති/ පැමිණෙයි).
(iv) (පාලකයෝ/පාලකයන්) ආදර්ශවත් (වේ ද/ වෙත් ද) රටවැසියන් ද යහමග යනු ඇත.
(v) තම (සිසුහු/ සිසුන්) විභාගයෙන් ඉහළින් සමත් වෙති යි (ගුරුවරුන්/ ගුරුවරු) අපේක්ෂා කරති.

(ලකුණු 05×3 = 15යි)

**05.** පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. එහි අනු- අංගය දක්වන්න.

(i) **විදුහල්පතිතුමා** ගුරුවරුන් **හා** සිසුන්ගේ බුහුමන් **ලැබ** සේවයෙන් විශ්‍රාම ගියේ ය.
(විදුහල්පතිතුමා-සන්ධි, හා-නිපාත, ලැබ-ක්‍රියා)
(ii) **පොකුණෙහි** සුපිපි **නිලුපුල්** හිරු **බැස යද්දී** මිලින වෙයි.
(පොකුණෙහි-විභක්ති, නිලුපුල්-විභක්ති, බැස යද්දී-ක්‍රියා)
(iii) වේදිකාවට **පැමිණි** කුඩා **දරුදැරියෝ** මහත් **උද්‍යෝගයෙන්** රංගනයක යෙදුණහ.
(පැමිණි-කෘදන්ත, දරුදැරියෝ-සමාස, උද්‍යෝගයෙන්-විශේෂණ)
(iv) මතු **පරපුරට** ජීවත් වීමට සුදුසු **සුරක්ෂිත** රටක් **ගොඩනැගීම** වැඩිහිටියන්ගේ යුතුකමකි.
(පරපුරට-විභක්ති, සුරක්ෂිත-අව්‍යය පද, ගොඩනැගීම-කෘදන්ත)
(v) **අරුණලු** කැන්වලට ඉඩදෙනු **වස්** නිශා තොමෝ **තරුපහන්** නිවා දැමුවා ය.
(අරුණලු-සන්ධි, වස්-නිපාත, තරුපහන්-සමාස)

(ලකුණු 05×3 = 15යි)

06. (අ) පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

වසරක් පාසා පැවැත්වෙන ....................... ගී සැදෑව මෙවර ද සඳගමුව මධ්‍ය ....................... විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ දී උත්සවාකාරයෙන් පැවැත්විණි. නානාවිධ ....................... දිදුලන විදුලි බුබුළුවලින් වේදිකාව හා අවට පරිසරය අලංකාර විය. නන් ....................... යුත් විසිතුරු ඇඳුමෙන් සැරසී ගී ගැයූ .................... යෞවනියෝ කාගේත් අවධානයට ලක් වූහ. ප්‍රසංගය නැරඹීමට පැමිණි රසිකරසිකාවන්ගෙන් ..................... විදුහල් බිම පිරී ගියේ ය.

(වර්ණයෙන්, යොවුන්, පැහයෙන්, මහා, යෞවන, මහ)

(ලකුණු 1/2×6 = 03යි)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර දක්වන්න.

| | | |
|---|---|---|
| (i) නරන් + ඉඳු | (ii) සූ + අසූ | (iii) අත් + ලස් |
| (iv) සාධු + උක්ති | (v) දෙ + අත | (vi) රිය + ඇදුරු |

(ලකුණු 1/2×6 = 03යි)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) අතුපතරින් ගහන **තුරුලියගොමු** කුඩා **පක්ෂීන්ට** වාසස්ථාන සලසයි.
(ii) රෝහලේ දැඩිසත්කාර **ඒකකයෙහි** ප්‍රතිකාර ලැබූ රෝගියා වෛද්‍ය **ප්‍රතිකාරවලින්** සුවය ලැබී ය.
(iii) "**අහසින්** වැටෙන හැම වැහි බිඳුවක් ම අපතේ නොහැර ප්‍රයෝජනයට ගත යුතු ය." යන්න **මහපැරකුම්බාවන්ගේ** ප්‍රකාශයකි.

(ලකුණු 1/2×6 = 03යි)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

සුව පහසුවට විලාසිතාවට අකමැති කවුද ඒ නිසා විදුලි එළියෙන් බබළන දෙතුන් මහල් පහ ඇති ශීඝ්‍රගාමී රථවාහන ආදියෙන් කලබල වූ මහා වීථි ඇති පෙම් කෙළින මුවන් මෙන් කෙළි දෙළෙන් පසු වන තරුණතරුණියන් සහිත උයන් වතු ඇති මෙසේ නොයෙකුත් අලංකාරයෙන් පිරුණු නගරයන් පිටිසරබද ව ඇති වීම ගැන කන්කෙඳිරි ගාන්නා ඊර්ෂ්‍යාකාරයෙක් නොවන්නේ ද එහෙත් මේ සියලු ඔපය පවත්නේ සාගින්නට උඩින් නම් එය ඔපයක් ලෙස හැඳින්විය නොහැකි ය

(ලකුණු 1/2×6 = 03යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා නැවත ලියන්න.

(i) "මම ඊයේ මුහුදු වෙරළට ගියෙමි"යි මිතුරා පැවසී ය.
(ii) "අපරාධකරුවන් වහා ම අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කරන්න" යි විනිසුරුවරයා පොලීසියට නියෝග කළේ ය.
(iii) "අපි දිවි හිමියෙන් මත්පැන් නොබොමු"යි ඔවුහු ශපථ කළහ.

(ලකුණු 1×3 = 03යි)

07. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පුර්තුගීසි උවදුරෙන් බේරෙත් ම ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දකාරයන්ගේ පාලන බලයට යටත් විය. **අවුරුදු** එකසිය පනහක් පමණ පහතරට **ආණ්ඩු** කළ ඕලන්දකාරයෝ ද ශිල්ප ශාස්ත්‍රාදිය දියුණු කිරීමෙහි නිරත නොවූහ. වෙළෙඳාමෙන් ධනෝපායනය ඔවුන්ගේ එක ම **අභිලාෂය** විය. මේ සමයෙහි ස්වාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත්වල පැවැති නමුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළහ. කැඩී බිඳී යන පැරණි රදල ක්‍රමයකින් යුක්ත වූ උඩරට සිංහල සමාජය **අතර** මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ උසස් **අංග** විද්‍යමාන නොවී ය. සිංහල හෝ දමිළ හෝ යම්තම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමක් හැර අන් කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට හෝ නොතිබුණේ ය. අවුරුදු තුන්සියයකට පෙර පටන් පිරිහෙමින් පැවැති චිත්‍රශිල්පයත් සංගීතයත් මේ කාලයේ දී සිංහලයන් **අතුරෙන්** සම්පූර්ණයෙන් ම බැහැර ගොස් තිබුණු බව පෙනෙන්ට ඇත්තේ ය. **ආගමික** කෘත්‍යයන්ට ද යාගහෝමාදියට ද අත්‍යවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රක්ෂාවක් කොට ගත් ශික්ෂාකාමී මිනිස්සු නාට්‍ය ශිල්පය **ආරක්ෂා** කළහ. ලංකාවේ පැරණි කලාවන් අතුරෙන් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර ශේෂ ව පැවැතුණේ මේ නිසා ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.
(ii) නොතිබුණේ ය, ස්වාධීන, ගැනීමත් යන වචනවල පිළි වෙන වෙන ම ලියන්න.
(iii) ගැටය සහිත ඇලපිල්ලක්, රේඵයක්, සඤ්ඤක අකුරක් ඇතුළත් වචනය බැගින් ලියන්න.
(iv) තාලුජ හා මූර්ධජ ඌෂ්මාක්ෂර දෙකක් සහිත වචන තුනක් ලියන්න.
(v) ධනෝපායනය, අත්‍යවශ්‍ය, යාගහෝමාදිය යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 05×3 = 15යි)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රයෝජ්‍ය ක්‍රියාව
(ii) පරරූප සන්ධිය
(iii) අර්ධානුනාසිකාක්ෂර (සඤ්ඤක අක්ෂර)
(iv) දකාරාර්ථ සමාසය
(v) පුරුෂවාචී සර්වනාම

(ලකුණු 05×3 = 15යි)

***